**සිංහල පරිවර්තනය**

# උතුරු පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරු වලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2021

උතුරු පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින, **I වගුවෙහි** සඳහන් වන තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් පැවැත්වීමට නියමිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වනුයේ 12.03.2021 වේ.

- **වගුව –I**

| **විභාගයේ නම** | **තනතුරු අංකය** | **පුරප්පාඩු සංඛ්‍යාව** | |
|---|---|---|---|
| | | **පුරුෂ** | **ස්ත්‍රී** |
| උතුරු පළාත් පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තු සේවයේ සහකාර මේට්‍රන් තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ **විවෘත** තරග විභාගය – 2021 | **01** | **01** | 02 |
| උතුරු පළාත් පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තු සේවයේ නිවාස මව යන තනතුරේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ **විවෘත** තරග විභාගය – 2021 | **02** | **-** | 13 |
| උතුරු පළාත් පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තු සේවයේ පෙර පාසල් ගුරු සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ **විවෘත** තරග විභාගය – 2021 | **03** | **-** | **01** |

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද **I** වන වගුවේ සඳහන් කර ඇති පරිදි එම තනතුරු වලට අදාල සේවා ව්‍යවස්ථා සංග්‍රහය/බඳවා ගැනීමේ පටිපාටියේ නිර්දේශ කරන ලද කොන්දේසීන් හා ආයතන සංග්‍රහයේ විධිවිධානයන් ද, මුදල් රෙගුලාසීන්, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** හා **2013.07.03** වන දින දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වූ ආයතන පටිපාටි රීති සංග්‍රහය, ගරු ආණ්ඩුකාරවරගේ අංක **G/NPC/A5/HG/Approval/ 2020** හා 2020.12.18වන දින දරණ ලිපිය යනාදියට යටත්ව තෝරා ගන්නා ලද විභාග අපේක්ෂකයන් **වගුව – I** වන වගුවේ සඳහන් කර ඇති තනතුරු වල III වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 තරග විභාගයේ III වන ශ්‍රේණියට සමත් වන විභාග අපේක්ෂකයන් පත්වීම් දින සිට වසර තුනකට (03) පරිවාස කාලයකට යටත් කොට III වන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කර ඇති පරිදි උක්ත තනතුරු වල III වන ශ්‍රේණියට බඳවා ගත් දින සිට වසර තුනක (03) කාල පරිච්ඡේදය තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්විය යුතුයි.

පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි විෂයන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. පත්කිරීමට නියමිත සංඛ්‍යාව **වගුව –I** හි දක්වා ඇති පරිදි වේ. කෙසේ වුවද දන්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාව සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු පූර්ණය නොකර සිටීමේ බලතල පත්වීම් බලධාරියා සතුය.

## 03 වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 පරිදි, වැටුප් කාණ්ඩය **MN 1 – 2016** පරිදි **වගුව –I** හි දක්වා ඇති තනතුරු වලට අදාල ඒකාබද්ධ වැටුප් ප්‍රතිශතය වනුයේ රුපියල් **27,140 – 10 x 300 - 11 x 350 - 10 x 495 – 10 x 660 – 45,540/-කි**. (රුපියල් 28,040.00 යන වැටුප් පියවරට ප්‍රථම පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි)

## 04 සාමාන්‍ය සුදුසුකම් :-

04.1 විභාග අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුයි.

04.2 අයදුම්කරුවන් උතුරු පළාතේ මිනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය මනා ශාරීරික නිරෝගිතාවයකින් සිටිය යුතු අතර මනා චරිතවත් පුද්ගලයකුද විය යුතුයි.

04.3 අ) උතුරු පළාත ස්ථිර පදිංචිය කරගත් අය විය යුතුයි. අදාළ ඉල්ලුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම වසර හයක (06) කාල පරිච්ඡේදය තුළ අවම වශයෙන් වසර තුනක්වත් (03) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතු යි.

**හෝ**

ආ) අයදුම්කරුවන් හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අවම අවුරුදු පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි **(*සම්මුඛ පරීක්ෂණයේ දී තම ඡන්ද නාම ලේඛනයෙන් උපුටා ගන්නා ලද සහතික කරන ලද උපුටනය ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට (12.03.2021) හෝ ඊට ප්‍රථම මෙම තනතුරු සඳහා කැඳවා ඇති **සියළුම සුදුසුකම්** අයදුම්කරුවන් විසින් සපුරා තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

| තනතුරු අංකය | තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| **විවෘත තරඟ විභාගය** | | | |
| 01 | සහකාර මේට්‍රන් | අ.පො.ස (සා/පෙ) විභාගයෙන් එකවර භාෂාව හෝ සාහිත්‍යය (දෙමළ/සිංහල/ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට(04) සම්මාන සාමාර්ථයන් සමඟ විෂයයන් හයක් 06) සමත්වී තිබිය යුතුයි. **ඒ සමඟම** අ.පො.ස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් එක විෂයයක් සමත්වී තිබිය යුතුයි. (සාමාන්‍ය පරීක්ෂණය හා ඉංග්‍රීසි විෂයය හැර) | රජය විසින් අනුමත ආයතනයක මාස හයකට 06) නොඅඩු ළමාරක්ෂක හා යොවුන් ආරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකපත් හිමිකර තිබිය යුතුයි. |
| 02 | නිවාස මව | | |
| 03 | පෙර පාසල් ගුරු සේවය | අ.පො.ස (සා/පෙ) විභාගයෙන් එකවර භාෂාව හෝ සාහිත්‍යය (දෙමළ/සිංහල/ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට(04) සම්මාන සාමාර්ථයන් සමඟ විෂයයන් හයක් 06) සමත්වී තිබිය යුතුයි. **ඒ සමඟම** අ.පො.ස (උ/පෙ) විභාගයෙන් අවම වශයෙන් එක විෂයයක් සමත්වී තිබිය යුතුයි. (සාමාන්‍ය පරීක්ෂණය හා ඉංග්‍රීසි විෂයය හැර) | රජය විසින් අනුමත ආයතනයක මාස හයකට 06) නොඅඩු පෙර පාසල් ඩිප්ලෝමා සහතිකයක් හිමි කර තිබිය යුතුයි. |

**ඇ) වයස්සීමාව :-**

අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ **වයස අවුරුදු 18ට නොඅඩු** හා **වයස අවුරුදු 30** නොවැඩි විය යුතුයි.

## 06 බඳවා ගැනීමේ පරිපාටිය :-

6.1.1 ලිඛිත පරීක්ෂණයක් මගින් කුසලතාව පදනම් කොටගෙන, බලාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගැනීමේ පටිපාටීන්, ජාතික හා පළාත් ප්‍රතිපත්තීන් යනාදියට අනුකූලව **වගුව I** හි සඳහන් විවෘත තරඟ විභාගයට අදාළ තනතුරු සඳහා බඳවා ගනු ලැබේ. මෙම දැන්වීම හරහා කැඳවා ඇති සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු

ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වන විට මෙම තනතුරට හිමි අයිතිවාසිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් වලට අදාල ලියකියවිලි ද පරීක්ෂා කරන අතර මේ සඳහා ලකුණු කිසිවක් ප්‍රදානය කරන්නේ නැත.

6.1.2 ඉහත පරිදි සුදුසුකම් ලබා ඇති **විවෘත තරග විභාගයට** අදාල අයදුම්කරුවන්ගෙන් **ලිඛිත විභාගයෙන්** සුදුසුකම් ලබන අපේක්ෂකයන් ලබා ගන්නා **සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් ඉහල ලකුණු අනුපිළිවෙළින්, පවතින පුරප්පාඩු අනුව පත්වීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.**

## 07. විභාග ගාස්තු :-

අපේක්ෂකයන් පදිංචි වී සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් ගෙවා **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ගේ **"3401"** යන ගිණුමට මුදල් බැර කළ කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා එවිය යුතුයි. මොනම හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලබන අතර මෙම ගාස්තුව වෙනත් කිසියම විභාගයක් සඳහා මාරු කිරීමට අවසර දෙනු නොලැබෙ.

## 08. අයදුම්කරන ක්‍රමය :-

08.1 මෙම දැනවීම අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව A4 ප්‍රමාණයේ (21 සෙ.මී x 29 සෙ.මී) කඩදාසියක 1 සිට 10 දක්වා තිබෙන ඡේද පළමු පිටුවේ ද, 11 සිට 14 දක්වා තිබෙන ඡේද දෙවන පිටුවේ ද, ඉතිර කොටස් අනෙක් පිටුවේ ද ආවරණය වන පරිදි අයදුම්පත සකස් කර ගත යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත 12.03.2021 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන පරිදි, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැල මඟින් යොමු කළ යුතුයි.

08.2 එක් තනතුරකට අමතරව අයදුම් කිරීමට මනාප අයදුම්කරුවන් එක් එක් තනතුරු වලට අදාලව වෙන වෙනම අයදුම්පත්‍ර යොමු කළ යුතු අතර විභාග ගාස්තු ද තනතුරුවලට අදාලව වෙන වෙනම ගෙවා කුවිතාන්සි ලබා ගෙන එම අයදුම්පත්‍ර වල අමුණා යොමු කළ යුතුයි.

08.3 අයදුම්පත්‍රය / අයදුම්පත්‍ර යොමු කරන ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ ඔබ විසින් **"අයදුම්කරන තනතුරේ නම"** සඳහන් කළ යුතුයි. අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා අවශ්‍ය තොරතුරු සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.4 අයදුම්පතේ ඡායා පිටපත ඔබ බාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් හෝ පූර්ව නිශ්චිත පිටපත් යනාදීන් භාරගනු නොලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙ ලේකම් විසින් නිකුත් කරනු ලැබේ. **විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරු විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුයි.**

08.5 අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුමකරුවන්ට ප්‍රවේශපත් නිකුත් කළ පසු ඒ පිළිබඳව පුවත්පත් මඟින් දැන්වීමක් නිකුත් කරනු ලැබේ. දැන්වීම පළවූ පසු යම්කිසි අපේක්ෂකයකුට අවම වශයෙන් විභගය පැවැත්වීමට නියමිත දින තුනකට (03) ප්‍රථම හෝ ප්‍රවේශ පත්‍ර ලැබුණේ නැතිනම්, ඒ පිළිබඳ පහත සඳහන් තොරතුරු සමඟ, **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක: 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්වීමට කටයුතු කළ යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, ෆැක්ස් අංක - 021 221 9940)

**ඉදිරිපත් කළ යුතු විස්තර :-**
**විස්තර සඳහන් ලිපියක්, අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ පිටපතක්, ප්‍රවේශපත්‍ර යොමු කිරීමට අවශ්‍ය ෆැක්ස් අංකයක්.**

08.6 විභාගයට අයදුම් කරන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සුදුසුකම් සම්පූර්ණ කර නැති අපේක්ෂකයන්ගේ අයදුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ හා සම්බන්ධ දැන්වීම් කිසිවක් නිකුත් කරනු නොලැබේ.

## 09. අනන්‍යතාවය තහවුරු කිරීම :-

විභාග අපේක්ෂකයන් තමන් පෙනී සිටින සෑම විෂයන්ටම විභාග ශාලාධිපති තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය තහවුරු කළ යුතු බව ඉල්ලා සිටිනු ලැබේ. අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එක් ලියවිල්ලක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම් පත

(ii) වලංගු ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රය.

(iii) රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් කරන ලද ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන විභාග අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමේ හිමිකම **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත,** ගේ අභිමතය පරිදි ප්‍රතික්ෂේක කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම:-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතා අවධානයෙන් යුතුව සත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. මෙම විභාග නීතිරීති ප්‍රකාර කිසියම් අපේක්ෂකයෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමණ අවස්ථාවකදී හෝ වුව ද සුදුසුකම් සම්පූර්ණ කර නැති බවට අනාවරණය වන්නේ නම්, එම අපේක්ෂකයාගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති යම්කිසි තොරතුරක් අසත්‍ය බවට ඔප්පු වුවහොත් ඕනෑම අවස්ථාවක එම පුද්ගලයා පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ඇත.

## 11. අත්සන සහතික කිරීම :-

**අයදුම්කරුවන් සියළු දෙනාම තම අත්සන සහතික කරවා ගැනීම අත්‍යාවශ්‍ය වේ.** රජයේ ආයතනයක් මඟින් අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධරයකු මඟින් තම අත්සන සහතික කරවා ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී සාම විනිසුරු, දිවුරුම් නිලධාරී, නීතිඥවරයකු, නොතාරිස්, නාවික හමුදා, යුද හමුදා, ගුවන් හමුදාවන්හි සේවයේ නියුතු නියෝගලත් නිලධාරියකු, **රුපියල් 498,960.00 ට නොඅඩු** වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව කටයුතු කරන පූජක පක්ෂයේ පූජකයකු විසින් සහතික කළ යුතුය.

## 12. විභාගය පරිපාටිය :-

මෙම විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර දෙකකින් සකස් කරනු ලබන අතර දෙමළ භාෂා මාධ්‍යයන් ගෙන් පැවැත්වීමට නියමිතය සිංහල භාෂා මාධ්‍යයෙන් අයදුම්පත්‍ර යොමු වුවහොත් සිංහල අයද භාෂා මාධ්‍යයෙන් ද විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. අයදුම්කරන භාෂාව පසුව වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. විෂය මාලාව පහත සඳහන් පරිදි වේ.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | භාෂණ හැකියාව හා සාමාන්‍ය දැනුම | **භාෂණ හැකියාව :-**<br>කෙටියෙන් ලිවීම, අවබෝධය, වැරදි හඳුනා ගැනීම, පහසු ව්‍යාකරණ භාවිතය යන කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කරනු වස් ප්‍රශ්න අඩංගු වන ප්‍රශ්න පත්‍රයකි.<br>**සාමාන්‍ය දැනුම :-**<br>තනතුර ආශ්‍රිත විෂයන් හා කරුණු පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අංක ගණිතය, තර්කාණුකුල හැකියා හා සාමාන්‍ය බුද්ධිය සම්බන්ධයෙන් අයදුම්කරුගේ දැනුම මැනීමට සකස් කරන ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 |

මෙම විභාගයෙන් සමත්වීමට එක් එක් විෂයයන් සඳහාම ලකුණු 40% ක් ලබාගත යුතුයි

13. **විභාග ප්‍රතිඵල** :-

විභාග අපේක්ෂකයන් සඳහා විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් සභා අන්තර්ජාලය මගින් නිකුත් කරනු ලැබේ. පසුව විභාගයට පෙනී සිටි විභාග අපේක්ෂකයන් සියල්ලන්ටම තැපැල් මගින් යොමු කරනු ලැබේ.

14. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ බලය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුය. මෙම නිවේදනයේ දෙමළ හා සිංහල යන භාෂා මාධ්‍යයන් අතර යම් කිසි අනනුකූලතාවයක් පැන නගින අවස්ථාවක දී දෙමළ මාධ්‍යයේ නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ..

***එස්. තිරුවාකරන්***
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත්.
22.02.2021